JSS 2025 3(1): 148-161

Journal of Social Sciences (JSS)
Volume 03 – Issue 01

DOI: http://doi.org/10.4038/jssnisd.v3i1.30

# A Conceptual Analysis on Jain Philosophy

## ජෛන දර්ශනය පිළිබඳ සංකල්පීය විග්‍රහයක්

**Herath H.M.N.D.** [1]

[1]Department of Philosophy, University of Kelaniya, Sri Lanka

**Email :** nimansaherath12@gmai.com

## ABSTRACT

*According to philosophical analysis, Indian Philosophy is unique. Bharatīya or Indian Philosophy, which has received the attention of philosophers and scholars from different countries, has a long history and is a complex and continuous development made up of various schools of thought. There is no agreement among the ages about its origin, but it is believed to be belonged to around 2500 B.C. It is a concept that the Indian thinker clarified that philosophy is not only intellectualism or ethics but transcends both. Indian philosophy was enriched by the combination of various philosophical systems, and was interpreted under a metaphysical and religious background. Those philosophical systems have built their own identity through the metaphysical, epistemological, and ethical aspects that are mutually exclusive through the five phases. Accordingly, he was concerned in presenting deep and valuable philosophical ideas while understanding that value contained in the above philosophy. The non-Vedic epic stage in Indian philosophy, which grew up in association with the dual tradions of Vedic and non-Vedic, is made up of the fourfold philosphical systems of Ājivaka, Lokāyata, Jain and Buddhist. There, the Jain philosophy used to criticize that the Vēdic and Upanishads are filled with concepts that have a philosophical value capable of surprising the deep Western Philosopher. The Jain philosophy which was led by its own concepts to understand the reality by teaching non-violence, and giving early ideas about the possibility of knowledge, has led to the realization of liberation through single knowledge.*

***Keywords –*** *Jainism, Indian Philosophy, Anekantism, Knowledge*

**සංක්ෂේපය**

දාර්ශනික විග්‍රහයන්ට අනුව ඉන්දියානු දර්ශනයට හිමි වන්නේ සුවිශේෂිත්වයකි. පෙර අපර දෙදිග දාර්ශනිකයන්ගේ හා විද්වතුන්ගේ නොමඳ අවධානයට පාත්‍ර වූ භාරතීය හෙවත් ඉන්දියානු දර්ශනය දිගු ඉතිහාසයකට හිමිකම් කියන අතර ඉතා සංකීර්ණ හා අඛණ්ඩ වර්ධනයකින් යුක්තව විවිධ චින්තන ධාරාවන්ගේ එකතුවෙන් සුසැදි වූවකි. එහි ආරම්භය පිළිබඳව වියතුන් අතර එකඟතාවයක් නොවන නමුත් ක්‍රි.පූ. 2500 පමණ කාලයට අයත් වන බව සැලකේ. දර්ශනය වනාහි හුදු බුද්ධිවාදයක් හෝ ආචාරවාදයක්ම පමණක් නොව ඒ ද්විත්වයම ඉක්ම වන්නක් බව භාරතීය චින්තකයා පසක් කරන්නා වූ සංකල්පයකි. මෙසේ ඉන්දියානු දර්ශනය නානාවිධ වූ දර්ශන පද්ධතීන් කිහිපයක එකතුවෙන් සුපෝෂණය වූ අතර පාරභෞතික හා ආගමික පසුබිමක් යටතේ විවරණය වූවකි. ප්‍රධාන වශයෙන් පස්වැදෑරුම් අවධීන් ඔස්සේ එකිනෙකට අවේණික වූ පාරභෞතික, ඥානවිභාගාත්මක, ආචාරවාදී අංශයන් තුළින් එම දර්ශන පද්ධතීන් ස්වකීය අනන්‍යතාවයක් ගොඩ නගා ගෙන ඇත. ඒ අනුව යථෝක්ත වූ දර්ශනයන්හි අන්තර්ගත සනාතනික වටිනාකම ඉන්දියානු දර්ශනය මනාව වටහා ගනිමින් ගැඹුරු අගනා දාර්ශනික මතවාද ඉදිරිපත් කිරීමෙහිලා උත්සුක විය. වෛදික හා අවෛදික යන ද්විත්ව සම්ප්‍රදායන් ඇසුරෙහි වැඩී වර්ධනය වූ ඉන්දියානු දර්ශනය තුළ අවෛදික වූ වීරකාව්‍ය අවධිය ආජීවක, ලෝකායත, ජෛන හා බෞද්ධ වශයෙන් සතරවැදෑරුම් වූ දාර්ශනික පද්ධතීන් වලින් නිර්මිතය. එහිදී වෛදික හා උපනිෂද් මතාන්තර විවේචනයට ලක් කරමින් ප්‍රභාවිත වූ ජෛන දර්ශනය ඊටම ආවේණික වූ ගැඹුරු බටහිර දාර්ශනිකයා මවිතයට පත් කරලීමට සමත් දාර්ශනික වටිනාකමකින් අනූන වූ සංකල්ප වලින් ගහණය වී ඇත. අවිහිංසාව ගුරුකොට ගනිමින් ඥානයේ භව්‍යතාවය පිළිබඳව මුල්කාලීන අදහස් දක්වමින් යථාර්ථය අවබෝධ කරනු වස් ස්වකීය සංකල්ප මෙහෙය වූ ජෛන දර්ශනය කේවළ ඥානය තුළින් විමුක්තිය සාක්ෂාත් කර ගැනීමට මඟ පාදා ඇත.



**මුඛ්‍ය පද** - ජෛන, ඉන්දියානු දර්ශනය, අනේකාන්තවාදය, ඥානය


## 1. හැඳින්වීම

භාරතීය දර්ශනය පෙරදිග දාර්ශනික ඉතිහාසය තුළ අද්වීතිය ස්වාභාවයක් ගනී. නානාවිධ මාර්ගයන්ගෙන් සමන්විත එය අන්‍යෝන්‍ය වශයෙන් ලත් දැනුම් සම්භාරයක් ඔස්සේ පෝෂණය ලබමින් වැඩී වර්ධනය විය. කාල නිර්ණය අනුව වර්ෂ සහස්‍ර ගණනාවක් එහා වූ ඈත අතීතයක් වාග් විද්‍යාත්මක ලක්ෂණ අධ්‍යයනයෙන් හෙළි වේ. කාල්පනික විශ්වාස පදනම් කර ගනිමින් මිනිස් ඇදහිලි විශ්වාස මෙන්ම දාර්ශනික පසුබිමක් ආශ්‍රිතව මෙය ගොඩනැගි බව සාහිත්‍ය මූලාශ්‍ර හේතු සපයයි (පඤ්ඤාකිත්ති හිමි, 1999). නමුත් මූලාරම්භයේදී විචාරයෙන් යුත් තාර්කික සංකල්පීය බවක් ඉන්දියානු දර්ශනයෙන් ප්‍රකට නොවීය. බටහිර දාර්ශනික චින්තන ධාරා ඉපැරණි ග්‍රීසියේ ආරම්භ වීමටත් පෙර ක්‍රි. පූ. 2000 - 2500 පමණ වූ කාලයේදී කිසිදු බාහිර බලපෑමකට ලක් නොවී වැඩියුණු වූ චින්තන ධාරා රැසක් භාරතය තුළ පැවතිණි.


භාරතීය දර්ශනය මූලික වශයෙන් කොටස් ද්විත්වයකට ප්‍රභේද වේ.

- වෛදික (ආස්තික)
- අවෛදික (නාස්තික)

සියුම් සංකීර්ණ ඉගැන්වීම් මගින් ප්‍රකට වන භාරතීය දර්ශනය අඛණ්ඩ වූ වර්ධනයකට හිමිකම් කියයි. මෙය දාර්ශනික ගුරුකුල හා මතවාද ගණනාවකින් සුපෝෂණය වී ඇත.

මෙම ඉන්දීය දර්ශනය අවධි කිහිපයක් ඔස්සේ විකාශනය වන්නට විය.

**ඉන්දීය දර්ශන සම්ප්‍රදායන්**




(පඤ්ඤාකිත්ති හිමි, 1999)

මේ අතර වීර කාව්‍ය අවධිය අවෛදික අවධිය අතර ප්‍රධාන වේ. මහාභාරතය, රාමායනය හා භගවත්ගීතාව වැනි වීර කාව්‍ය රචනා වූ භාරතීය දර්ශනයේ ද්විතියීක කාල පරිච්ඡේදය පැවති සාම්ප්‍රදායික චින්තන සම්ප්‍රදායන්ට පටහැනි ඉගැන්වීම් ඉදිරිපත් වූ ඥාන මූලික හා විචාරශීලී අවධියක් විය. භක්ති මාර්ගයෙන් බැහැරට ගොස් අව්‍යාජ දාර්ශනික විමර්ශන හැසිරවීම හේතුවෙන් නව සංකල්පීය විකල්පයන්ගේ පිබිදීමක් මෙම අවෛදික අවධිය තුළින් හඳුනාගත හැකිය. ලෝකායත දර්ශනයට පසු බිහි වූ දාර්ශනික සම්ප්‍රදායන් අතරින් ජෛන දර්ශනයට සුවිශේෂී ස්ථානයකි. ජෛන ආගම ආශ්‍රයෙන් ගොඩ නැගි දාර්ශනික අදහස් පාදක කර ගනිමින් මෙය ගොඩ නැගී ඇත. පූර්ව බුද්ධකාලීන දර්ශනයක් ලෙස මෙම දර්ශනය ගොඩනැගි බවට ඉතිහාසය සාක්ෂි දරයි. සාම්ප්‍රදායික දර්ශනයන් ලෙස පිළිගැනුණු වෛදික හා උපනිෂද් දර්ශනයන්ට ප්‍රතිවිපක්ෂව ස්වකීය අදහස් ඉදිරිපත් කිරීම හේතුවෙන් එනම් වේදය පහත් කොට සැලකීම හේතුවෙන් භාරතීය උගතුන් සිය සාහිත්‍යගත ග්‍රන්ථයන්හි ජෛන දර්ශනයට කිසිදු පරිච්ඡේදයක් හෝ වෙන් කිරීමට රුචිකත්වයක් නොදැක්වීය.

ජෛන ධර්මයේ පැරණි නාමය වන්නේ 'නිගන්ඨ' යන්නයි. නිර්ග්‍රන්ථ යනු කලියේ රූපාන්තරයකි. මෙහි සර්වඥ වූ, රාග, ද්වේශ ජයග්‍රහණය කළ, තුන් ලොව පුදන, මනාව අර්ථවාදයේ සිටි, පරමේශ්වර වූ සිද්ධ පුරුෂයන් අර්හත් යන නමින් හඳුන්වා ඇත.

එලෙස ප්‍රචාරය වීම නිසා මෙම ධර්මය 'අර්හත්' යන නමින්ද අන්වර්ථ ගැන්වේ (පඤ්ඤාකිත්ති හිමි, 1999). ජෛන දර්ශනය තුළදී මෙම ජෛන යන නාමය කෙරෙහි පෙර අපර දෙදිග විචාරකයන්ගේ අවධානය යොමු වී ඇත. ජෛන යනු 'ජින' හෙවත් 'ජය ගැනීම' අරුත් ගැන්වෙන 'ජි' ධාතුවෙන් නිෂ්පන්න වූවකි. පදානුගතව ගත් කළ එහි අදහස වන්නේ 'පූර්ණ ලෙස ආත්ම දමනයේ යෙදුණු' යන්නයි. මේ නිසා ආත්ම දමනයේ යෙදුණු ජෛන ශාස්තෘවරු හැඳින්වීම සඳහා 'ජයගත්', 'ජින' හෙවත් 'ජෛන' යන නාමය යෙදේ. ජෛන චින්තකයන්ට 'තීර්ථංකර' ලෙස අන්වර්ථ නාම ගැන්වේ. තීර්ථ යනු තොටුපළයි. ඒ අනුව තීර්ථංකර යනුනෙහි පදානුගතිය වන්නේ තොටුපළ කරවන්නා හෙවත් තොටියා යන්නයි. සංසාර නදියෙන් එතෙර කරවන තොටුපළ ජෛන දර්ශනය නම් එම තොටුපළ කරවන ජෛන ශාස්තෘවරුන් තීර්ථංකර ලෙස හැඳින්වේ.

ජෛන ශාස්තෘවරු ගණනින් 24 කි. මෙම සම්ප්‍රදාය තුළ ඉහළම ඥානය වූ කේවල ඥානය ලබා ගත් පිරිසක් ලෙස මෙම ශාස්තෘවරුන් පෙන්වා දිය හැකිය. ජෛන ආගමේ ආරම්භකයා වන්නේ වර්ධමාන මහාවීරයන් නිගණ්ඨනාථපුත්ත හා ජින යන නම් වලින් අන්වර්ථ ගැන්වේ. ජෛන මහාවීරයන් බුදු සමය හා සමකාලීනයෙකි. නමුත් බුදුන් වහන්සේට පෙර හෙතෙම අපවත් විය. ජෛන ආගමේ පුරෝගාමියෙකු වූ සිද්ධාර්ථ වර්ධමාන මහාවීරයන්ගේ පියා විය. මව ත්‍රිශාලා වූ අතර භාර්යාව යසෝදා නම් විය. හෙතෙම වයස අවුරුදු 28 දී අභිනිෂ්ක්‍රමණය කර වසර 12 ක් ශරීරයට අධික දුක් දෙමින් දුෂ්කර ක්‍රියා කළ අතර ඉන් අනතුරුව කේවල ඥානයට පත් වූ කල්හි නිගණ්ඨනාථපුත්ත හෙවත් ජින යන නමින් හැඳින්වීය. මොහු ශාස්තෘ පරම්පරාවක විසි හතර වැනියා වූ නිසා තීර්ථංකර ජින යන නමින් හැඳින්වේ. මෙම අදහස බුදු දහමේ සූවිසි විවරණයට සමානය (විමලධම්ම හිමි, 2002).

භාරත දේශය තුළ ප්‍රධාන පෙළේ දර්ශන සම්ප්‍රදායක් ලෙස සැලකෙන ජෛන දර්ශන සම්ප්‍රදාය පාදක කර ගනිමින් රචනා වූ සාහිත්‍ය ග්‍රන්ථ ගණන ඉතා විශාලය. එමෙන්ම ජෛන ආගමේ පැරණි ස්වරූපය පාලි ත්‍රිපිටක ග්‍රන්ථ ආශ්‍රයෙන් මනාව විශද වේ. මෙම ජෛන ග්‍රන්ථ ග්‍රන්ථාරූඪ කිරීම ඇරඹියේ ක්‍රි. ව. 5 වන සියවසේදී ය. ජෛනයන්ගේ භාෂාව වූ අර්ධ මාගධි භාෂාවෙන් මෙම ග්‍රන්ථ රචිතය. ජෛන ග්‍රන්ථ මේ වන විට අසූ හතරක් පමණ රචනා වී ඇත. (විමලධම්ම හිමි, 2002, 44) අනේකාන්ත වාදය, ජීව හා පුද්ගල ආදී වූ දාර්ශනික සිද්ධාන්තයන් පිළිබඳව විවේචනයන් මෙම ග්‍රන්ථ වල දක්නට ලැබේ.

ජෛන දර්ශනය තුළ ඉතා ගැඹුරු සංකල්පීය දර්ශනවාදයක් අන්තර්ගත වේ. ජෛන දර්ශනයට පූර්වයෙන් පැවති චාර්වක දර්ශනය නැතිනම් ලෝකායත මඟින් සාම්ප්‍රදායික ඉගැන්වීම් වල විවිධ මති මතාන්තර තිබූ නිසා ඒ පිළිබඳව සියල්ල සාවද්‍ය ලෙසත් සංශයවාදීන් සියල්ල සැකයටත් ආජීවකයන් සියල්ල නියතාවයකින් යුක්ත බවත් ප්‍රකාශ කළ අතර ජෛනයන් සියල්ල සාපේක්ෂතාවය මත පදනම් වන බව ප්‍රකාශ කළහ.

**2. ජෛන දර්ශනයේ නිකායන්**

ජෛන දර්ශනය මූලික නිකායන් ද්විත්වයක් යටතේ සාකච්ඡා කෙරේ. ඒ,

- ශ්වේතම්හර
- දිගම්හර ලෙසය.

(විමලධම්ම හිමි, 2002)

මෙලෙස නිකායන් ද්විත්වයකට ප්‍රභේද වීම තුළ ඓතිහාසික විකාශනයක තොරතුරු විෂද වේ. වර්ධමාන මහාවීරගේ මරණින් පසු මෙම ධර්මයට රාජානුග්‍රහය ලැබුණි. මගධයේ නන්දවංශික නරපතියා හා කාලිංගයේ අධිපති අධිරාජ්‍ය ඛාරවෙල ජෛන ධර්මයට වැළඳ ගනිමින් මෙම ධර්මය ප්‍රචාරය කිරීමෙහිලා මහඟු සේවයක් ඉටු කළහ. තවද ආර්යවර්තය එක්සේසත් කළ මෞර්ය වංශයේ සංස්ථාපකයා වූ චන්ද්‍රගුප්ත මෞර්ය අධිරාජ්‍යයාද ජෛන අනුගාමිකයෙක් විය. මගධයේ ඇති වූ දේශපාලන ආරවුල් නිසා භද්‍රබාහු භික්ෂුවත්, චන්ද්‍රගුප්ත අධිරාජ්‍යයාත් මයිසූර් ප්‍රදේශයේ ''ශ්‍රවණබෙල් ගෝල්'' සමීපයේ තපසේ යෙදෙමින් සිට භද්‍රබාහු ආරවුල් සමථයකට පත්වීම නිසා උත්තර භාරතයට පැමිණියේය. එහිදී හෙතෙම ජෛන යතිවරයන්ගේ ආචාරයන් සම්බන්ධව වූ පරිවර්තනය දැක කණස්සල්ලට පත් විය. මෙකල සංඝභද්‍ර ජෛන සංඝයා අතර නේතෘත්වය දැරීය. ඔහු කාලානුරූපීව උග්‍ර තපසේ පිරිසිදු බව පසෙකලා නෙයෙකුත් සංශෝධන රැසක් ජෛන ධර්මය තුළ සිදු කළේය. පැරණි සංඝයා අතරත නග්න සිටීම ආදර්ශයක් වශයෙන් පැවතියද මගධ සංඝයා විසින් ශ්වේතම්හරයන් ශ්වේත වර්ණ වස්ත්‍ර හැඳීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. ඒ අනුව ක්‍රි. පූ. දෙවන සියවසේ ශ්වේතම්හර හා දිගම්බර යන භේදයන් ද්විත්වයක් ජෛන ධර්මය ආශ්‍රය කර ගනිමින් පහළ විය. තවද මෙම නිකාය භේදය ඇති වූයේ වර්ධමාන මහාවීරගේ පරිනිර්වාණයෙන් වර්ෂ 609 කට පසුවය (පඤ්ඤාකිත්ති හිමි, 1999).

මොවුන් දෙපිරිස තත්ව ඥානය පිළිබඳ මතවාදී වෙනසක් නොදැරුවද නොයෙක් විෂයන් පිළිබඳ ආචාරමය කරුණු ආශ්‍රිතව නොයෙකුත් වෙනස්කම් ප්‍රකට කෙරේ. දිගම්බර නිකායට අයත් ජෛනයන් දැඩි ප්‍රතිපත්තිගරුක සම්‍යග්දෘෂ්ටික පිරිසක් ලෙස එනම් ආගමික නියමයන් පිළිබඳ දැඩි බවක්ද ශ්වේතම්බර නිකායට අයත් පිරිස බොහෝ විට කාලීන වෙනස්කම් මත තම අදහස් වෙනස් කරගත් මිනිසාගේ දුර්වල බව සිහිකර ඇතැම් අංශ වල දැඩි නියමයන් ලිහිල් කළ පිරිසක් ලෙස සැලකේ. ශ්වේතම්බර යනු ශ්වේත වර්ණ වස්ත්‍ර දැරූවන් ය. මුළු දිශාවම වස්ත්‍රය කර ගනිමින් සිටි දිගම්බර නිකායේ ජෛනයන් ඒ හේතුවෙන් නිර්වස්ත්‍රව සිටිති. ආශාවන් ප්‍රහීන කිරීම මෝක්ෂයට සමීප වූවකි. මෙහිදී දිගම්බර නිකායට අයත් වූවන් සිය වස්ත්‍රයට හෝ කිසිදු ඇල්මක් සිදු නොකරන නිසාවෙන් ඔවුන් දිශාවම අම්භරය කර ගනිමින් නිර්වස්ත්‍රව සිටිති. දිගම්බරයන්ට අනුව කේවල ඥාන සම්ප්‍රදායට අයත් පුරුෂයෝ වූ කේවලීහු රාත්‍රි ආහාරය අනුභව නොකරති. තවද ස්ත්‍රීන්ට මෝක්ෂය ලැබිය නොහැකිය. ස්ත්‍රීන්ට පුරුෂ උත්පත්තියක් ලැබීමෙන් පසු මෝක්ෂ ප්‍රාප්තිය සඳහා විධානයන් දැක්වේ. මෙලෙස

සදාචාරාත්මක වත් පිළිවෙත් නැතිනම් ඒ ආශ්‍රිතව වූ ක්‍රියාදාමයක් ජෛන චින්තකයන් තුළ පැවති බව මේ අනුව පැහැදිළි වේ.

භුඞ්ක්තෙ න් කෙවලී න් ස්ත්‍රී මොක්ෂමෙති දිගම්බරඃ

ප්‍රාහුරේෂාමයං භෙදො මහාන් ශ්වේතාම්බරෙඃ සහ

(සර්වදර්ශන සංග්‍රහයෙහි ජිනදත්තසූරිගේ ශ්ලෝකය)

ශ්වේතම්බර සහ දිගම්බර යන සම්ප්‍රදායන් ද්විතවයට අමතරව 'යාපනීය' හෙවත් 'ගොප්‍ය' නමින් හැඳින්වූ සංඝයා වහන්සේලා පැරණි කාලයේ විසූ බවට පතළ කරුණකි. වි. සං. 250 කාලයේ පටන් මොවුන් පැවත ආ බවට දේවසේන සූරිගේ ප්‍රකාශයක සඳහන් ය. ඒ අනුව අනෙකුත් නිකායන් හා සමකාලීනව මෙම සම්ප්‍රදායද බිහි වූ බවට තොරතුරු හමු වේ. ස්‍යාද්ධාන්තිකව ගත් කළ දිගම්බර හා ශ්වේතම්බර නිකායන් ආශ්‍රිතව මොවුන් පිළිබඳ තොරතුරු ලබා ගත හැකිය. මෙම සංඝයා වහන්සේලා නග්න සිරුරෙන් යුතුව මොනර පිහාටු අතැතිව සිටියහ. තවද අත්ල ආහාරය පිණිස යෙදූහ. නග්න මූර්ති වලට පුද පූජා පැවැත්වූහ. එමෙන්ම වන්දනාමාන කරන ශ්‍රාවකයන්ට ධර්ම ලාභය ලබා දුන්හ. කරුණු අනුව ගත් කළ මොවුන් දිගම්බරයන් හා සමාන බව පෙනේ. ඔවුන් මෙන් ස්ත්‍රීන්ට මෙම ආත්ම භවයේදී එනම් පුරුෂ ආත්ම භවයක් ලබන තුරු මෝක්ෂය ලැබිය නොහැකි බව මෙම සංඝයා වහන්සේලාද පිළිගත්තකි. ශ්වේතම්බරයන් මෙන් පිඩු පිණිස හැසිර ආහාර අනුභව කළ හැකිය. විශාල වශයෙන් පැවති මොවුන්ගේ සාහිත්‍යමය මූලාශ්‍ර මේ වන විට විනාශ වී ගොස් ඇත (පඤ්ඤාකිත්ති හිමි, 1999).

**3. ඥානවිභාගාත්මක පදනම**

ජෛන මතයට අනුව ජීවය නම් ප්‍රාණය ඇත්තකි. ඥානය එහි වූ ප්‍රධාන ලක්ෂණයයි. එහි ස්වාභාවයෙන්ම අන්නත ඥානය විශිෂ්ට ය. කර්මයන්ගෙන් පිරී ඇති නිසා එහි පිරිසිදු චේතනාත්මක ස්වරූපය මිනිස් දෘෂ්ටියෙන් සදාකාලිකවම නැවතියද යහපත් චරිතයන් සේවනය කිරීමෙන් ජීවය තම පිරිසිදු ස්වරූපය නැවත ලබා ගත හැකිය. එය 'කෙවල්‍ය' නැතිනම් සර්වඥතාවයෙන් යුක්ත වේ.

බටහිර දර්ශනයට සාපේක්ෂව මෙම පංචේන්ද්‍රියානුබද්ධ ඥාන මාර්ග කෙරෙහි එතරම් තැකීමක් සිදු කර නොමැති බව පෙනී යයි. ලෞකික ප්‍රත්‍යක්ෂය ඇසුරින් ලබන ඥානය නියම ඥානයක් නොවන බව මොවුන්ගේ මතයයි. එය අපගේ චින්තනය හා සම්බන්ධ වේ. බාහිර ලෝකයේ අප ප්‍රත්‍යක්ෂ කර ගනු ලබන යමක් අප විවිධ සංකල්ප ඇසුරින් අවබෝධ කර ගැනීමද ඥානය කි. නමුත් ජෛනයන් ප්‍රකාශ කරනුයේ මෙම ඥානය මතභේදාත්මක බවයි.

ඥානය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට ප්‍රභේද වේ.

- පරොක්ෂ ඥානය
- අපරොක්ෂ ඥානය

මෙය ඇතැම් තැන්හි ප්‍රත්‍යක්ෂ හා පරොක්ෂ යනුවෙන්ද දැක්වේ. මෙම වචන දෙක ව්‍යඛ්‍යා කිරීමේදී ජෛන දර්ශනය අනෙකුත් දර්ශන අතරින් වෙනස් වේ. මෙහිදී 'ආත්ම සාපේක්ෂ ඥානය' ප්‍රත්‍යක්ෂ වන අතර 'ඉන්ද්‍රියමනඃ සාපේක්ෂ ඥානය' පරොක්ෂ නම් වේ. පරොක්ෂ ඥානය උමස්වාතිගේ විවේචනයට අනුව කොටස් දෙකක් වේ. ඒ, මති හා ශ්‍රැති යනුවෙනි. මෙම ඥාන ප්‍රභේද ඉන්ද්‍රියන්ගේ හා මනසේ සහායෙන් උපදී. අවධි, මන පර්යාය හා කේවල යන ත්‍රිත්වය ප්‍රත්‍යක්ෂය හෙවත් අපරෝක්ෂ ඥානයේ ප්‍රභේද වේ. මේවා ඉන්ද්‍රියයන්ගේ හා මනසේ සහායෙන් තොරවම හුදෙක් ආත්මයේ යෝග්‍යතා බලයෙන් උපදී. ඉන්ද්‍රියන්ගේ හා මනසේ ගැටීමෙන් හට ගන්නා වූ 'විෂය ඥානය' මති ඥානය නම් වේ. මෙය ඉන්ද්‍රිය සංජානනය යි. ස්මෘති, සංඥා, චින්තා, අභිනිර්බෝධ යනාදිය මතියට පර්යාය වේ. මතිය නැවත ප්‍රභේද දෙකකට බෙදේ.

- ඉන්ද්‍රිය ජන්‍ය - බාහිර ඉන්ද්‍රියයන් මඟින් උපදින ඥානය
- අනින්ද්‍රියජන්‍ය - මනසින් උපදින ඥානය

(පඤ්ඤාකිත්ති හිමි, 1999)

ශබ්දයෙන් හෙවත් ඇසීමෙන් නිර්මිත ඥානය 'ශ්‍රැති ඥානය' යැයි කියනු ලැබේ. මෙහිදී දැනුම පදනම් කර ගනී. මෙම මති හා ශ්‍රැති ඥානය එකිනෙකට සැසඳූ කල්හි ශ්‍රැති ඥානය දැනුම පෙරටු කර ගත් ඇති වන අතර මති ඥානය විද්‍යමාන වස්තුව තුළ පවතී. තවද ශ්‍රැති ඥානය අතීත, වර්තමාන හා අනාගත කාලත්‍රය විෂයෙහි පවතී. මති ඥානය තුළ ශබ්දය පිළිබඳ කිසිදු සඳහනක් නොමැත. ජෛනාගමයේ දොළොස් අංශයන්ගෙන් යුක්ත ඥානයට වශයෙන් පිවිසි ශ්‍රැති ඥානයට හා ගණධරයන්ට පසුව පිරිසිදු ඥානය ඇති ආචාර්යවරුන් විසින් රචනා කරන ලද ශාස්ත්‍රය පිළිබඳව වූ ඥානය අංශ වලින් බාහිර ශ්‍රැත ඥානය ලෙස හැඳින්වේ.

ප්‍රත්‍යක්ෂ ඥානය හෙවත් අපරොක්ෂ ඥානයේ ප්‍රභේදයන් වන්නේ අවධි, මනඃපර්යාය, කේවල යනාදිය වේ. ඈත පවත්නා වූ ව්‍යවධාන යුක්ත පදාර්ථයන් පිළිබඳ ඥානය 'අවධි ඥානය' වේ. යම් විටක සත්ත්වයා විශිෂ්ට වූ පිවිතුරු සාධනයන්ගේ සහයෙන් ආවරණීය වූ කර්මයන් ක්ෂය කිරීමෙහි යෙදී සිටීද එවිට දුර පවත්නා වූ පදාර්ථයන් පිළිබඳව වූ ඥානය ද තම ආත්මයේ යෝග්‍යතාව මත උපදී නම් එය 'අවධි ඥානය' වේ. යමෙක් හට මෙම අවධි ඥානය හට ගන්නා අතරතුරුම යමක් ප්‍රකට වේ නම් එය 'භාව ප්‍රත්‍ය' නම් වේ. යම් ඥානයක් සඳහා ව්‍රත නියම ආදියෙහි පටන් ගැන්මක් අපේක්ෂා කරයි නම් එය 'ගුණ ප්‍රත්‍ය' ලෙස හැඳින්වේ. යම් අයෙක්ගේ හිතේ ඇති වන ද්‍රෝහි කිරීම්, ඊර්ෂ්‍යා කිරීම් ආදී අදහස් දැන ගැනීමේ හැකියාව මනඃපර්යාය ඥානය' නම් වේ. නමුත් යම් විටක ඥානය පිළිබඳ සියලු වසා ඇති කර්මයන් නිත්‍ය වශයෙන්ම ක්ෂය කළහොත් එවිට ආත්මය තමාගේ පිරිසිදු සර්වඥ ස්වරූපය ලබයි. එමෙන්ම සර්වඥතා ආදී වූ ධර්මයන් ඔහුට ඇති වන අතර එය ප්‍රත්‍යක්ෂය පිළිබඳව වූ පාරමාර්ථික ස්වරූපය වේ. එය 'කේවල ඥානය' නම් වේ. මෙය ලබා ගත හැක්කේ යහපත් වූ චරිතයක් ගත කරන සිද්ධි පුරුෂයන්ට පමණි. පසුකාලීන යෝගාචාර්යයන් ප්‍රත්‍යක්ෂය හා පරෝක්ෂය වෙනත් දෘෂ්ටියකින් විග්‍රහ කර ඇත. ආචාර්ය හේමචන්ද්‍ර ප්‍රමාණ මීමංසාවේදීද ගුණරත්න විසින් ෂඩ්දර්ශන සමුච්චය ටීකාවෙහි ද ප්‍රත්‍යක්ෂයේ සාංව්‍යවහාරික හා පාරමාර්ථික වශයෙන් ද්විත්ව ප්‍රභේද ගැන්වේ. සාංව්‍යවහාරික ප්‍රත්‍යක්ෂය යනු මිනිස් ප්‍රත්‍යක්ෂයට ඉන්ද්‍රියයන්ගේ හා මනසේ උපකාරය ස්ථිර වශයෙන්ම අවශ්‍ය වීමයි. කේවල ඥානය

හෙවත් පාරමාර්ථික ප්‍රත්‍යය යනු ආවරණයන් විනාශ වීම නිසා චෛතසිකයන් ජීවයේ ස්වරූපයෙන් ප්‍රකට වීමයි. පරෝක්ෂ ඥානය පස් වැදෑරුම් වේ.

- ස්මෘති - දැනුමේ අවබෝධයෙන් හටගන්නා වූ අතීතය පිළිබඳව යථාර්ථ වශයෙන් ඇති වන ස්මරණය
- ප්‍රත්‍යාභිඥාන - මේ වස්තුව එයම යැයි ආදී වශයෙන් උපදිනා ඥානය
- තර්ක - උපලම්භ හා අනුපලම්භ නිමිත්ත ව්‍යාප්තිය පිළිබඳ ඥානය
- අනුමාන හේතුවෙන් සනාථ කළ හැකි අනුමාන
- ආගම - නුවණැති පුරුෂයන්ගේ හා ආගම වල ඇති වාක්‍ය වලින් උපදිනා ප්‍රාමාණික ඥානය

(පඤ්ඤාකිත්ති හිමි, 1999)

ජෛන න්‍යාය ප්‍රත්‍යක්ෂ, අනුමාන හා ආගම යන තෙවැදෑරුම් ප්‍රමාණයන් කෙරෙහි විශ්වාසය තබයි. ප්‍රත්‍යක්ෂයේ සත්තාවම සියල්ලටම වඩා ප්‍රධාන වේ. ජෛනාචාර්යයන් විසින් ප්‍රබල යුක්තීන්ගේ ආධාරයෙන් ලෝකව්‍යවහාරය සඳහා අනුමානයේ ප්‍රාමාණිකත්වය පිළිගත්හ. ජෛන දර්ශනයේ පදනම වන්නේ ප්‍රතිපාදිත සත්‍යයි. නමුත් ඔවුන් බ්‍රාහ්මණ ශාස්ත්‍රය ශ්‍රැති හා ස්මෘති වල ප්‍රාමාණිකත්වය නොයෙකුත් දුර්වලතාවයන්ගෙන් සමන්විත නිසා පිළිගැනීමට රුචිකත්වයක් නොදක්වති.

සාමාන්‍යයෙන් ඥානය නැවත ප්‍රභේද ගැන්වෙන්නේ කොටස් ත්‍රිත්වයකිනි. ඒ,

- දුර්ණය
- නය
- ප්‍රමාණ   යනුවෙනි.

(පඤ්ඤාකිත්ති හිමි, 1999)

අපට පෙනෙන වස්තුවක් අපට ඕනෑම අවස්ථාවක විද්‍යමාන වන්නේ නම් එය වෙනස් ආකාරයකින් ප්‍රතික්ෂේප වීම නිසා ඇති වන ඥානය 'දුෂ්ට නය' හෙවත් 'දුර්ණය' ලෙස හැඳින්වේ. වෙනත් ආකාරයකින් තොරව ප්‍රතික්ෂේප කළ වස්තුවක් ඇත්තේ යැයි කීම හා කොටසක් පිළිබඳ ඥානයෙන් යුක්ත වීම නිසා 'නය' නම් වේ. විද්‍යමාන වන්නා වූ යම්කිසි වස්තුවක් ස්‍යාත් සත් පිළිබඳව ඥාන හා අඥාන යන සියලු ධර්මයන් සංකලනය වීම නිසා එය සාධනයේ අවසානය වේ.

### 4. නය සංකල්පය

නය සංකල්පය යනු ජෛන දර්ශනය තුළ විමසුනට භාජනය වූ වැදගත් සංකල්පයකි. වස්තුන් පිළිබඳව වන සාපේක්ෂ නිරූපණය නයවාදය තුළින් අරුත් ගැන්වේ. ඕනෑම වස්තුවක් ධර්මාත්මක වීම තුළ එම වස්තුව දෘෂ්ටීන් ගණනාවක් නිරූපණය කිරීමෙන් ඊට අදාළ නය සංඛ්‍යාව අසීමිත වේ. නමුත් සාමාන්‍ය අර්ථයෙන් ගත් කළ එය ද්විතව ප්‍රභේද ගැන්වේ. ද්‍රව්‍යාර්ථික නය පර්යාර්ථික නය යම්කිසි වස්තුවක මෙම නය ප්‍රභේද දෙකම අන්තර්ගත වේ. ඒ අතරින් ද්‍රව්‍යාර්ථික නය යනු යම් කරුණක් නිසා විවිධ වූ පරිණාමයන් අතරත වස්තුවක ඒකත්වයක් ඇති කිරීමයි. එම ධර්මයන් යම් දේශයක හා

කාලයක වීම නිසා යම්කිසි වස්තුවක ඉපදීම ගෙනදීම පර්යාර්ථික නය නම් වේ. ද්‍රව්‍යාර්ථික නය නැවත තුන්වැදෑරුම් නය ලෙසද පර්යාර්ථික නය සතරවැදෑරුම් ලෙසද වන අතර එක්ව ගත් කළ එය සත් ආකාරයකින් දැක්විය හැකිය.

- නෛගම නය - කිසියම් ක්‍රියා පිළිවෙතක් මුළුල්ලේම දක්නට ලැබෙන අරමුණ මෙලෙස හැඳින්වේ.
- සංග්‍රහ නය - ක්‍රියාවක සාමාන්‍ය ලක්ෂණ සැලකීම. එනම් සත්තාව හෙවත් පැවැත්මේ ස්වාභාවයට සියලුම දේ අදාළ වේ.
- ව්‍යවහාර නය - ආනුභවික ඥානය පදනම් කරගත් ජන සම්මත මතයයි.
- ඍජු සූත්‍ර නය - ඒ මොහොතට පමණක් පවත්නා දේ සත්‍ය ලෙස ගැනීම. මෙය සත්‍ය වන්නේ ඉතා ක්ෂණිකවය.
- ශබ්ද නය - වචනයන්ගෙන් කෙරෙන දේ පද සහ ඒවායේ අර්ථ අතර පවතින සාපේක්ෂ සම්බන්ධතාවය යි.
- සමාභිරූඪ නය - උදාහරණ වශයෙන් නෙළුම් මල එයට පමණක් සීමා කර දැක්වීම. එනම් ජලයෙහි හෝ මඩෙහි නෙළුම නොතැවරෙයි.
- ඒවංභූත නය - වස්තුවක් නම් කළ හැක්කේ ඉන් අදහස් කරන අරමුණ සඵල වුවහොත් පමණි.

(විමලධම්ම හිමි, 2002)

වස්තූන් දෙස නය හෙවත් දෘෂ්ටිකෝණයන්ට අනුව බැලීමට හැකි අතර ද්‍රව්‍ය, ගුණ හා පර්යාය වශයෙන් ඒවා විවිධත්වයට පත් වේ. වස්තූන් නිර්මිත මූලික දේ ද්‍රව්‍ය ලෙසත් වස්තූන්හි නොවෙනස් ලක්ෂණය ගුණ ලෙසත් වස්තුවෙහි විවිධත්වයට පත්වන ස්වාභාවය පර්යාය ලෙසද දැක්විය හැකිය. ඒ අනුව යම් වස්තුවක් දෙස ද්‍රව්‍ය, ගුණ හා පර්යාය වශයෙන් ප්‍රත්‍යක්ෂ කළ හැකිය. එහිදී ද්‍රව්‍යමය දෘෂ්ටිකෝණයෙන් පවතී යැයි කිව හැකි වස්තුවක් පර්යාය දෘෂ්ටිකෝණයෙන් නොපවතී යැයි ප්‍රකාශ කළ හැකිය. ඒ අනුව විෂද කෙරෙන්නේ ඥානය භව්‍යතාවයෙන් යුක්ත බවයි. මන්ද දෘෂ්ටිකෝණයන්ට සාපේක්ෂව සත්‍ය රඳා පැවතීමයි. එසේ නම් කවර දෘෂ්ටිකෝණයෙන් විමසා බැලුවද අප කෙරෙහි පවතිනුයේ අර්ධ සත්‍යයකි. එබැවින් කිසිදු දිනක යම්කිසි වස්තුවක යථා තත්ත්වය සාමාන්‍ය පුද්ගලයාගේ ග්‍රහණයට හසු නොවන බව ජෛනයන්ගේ අදහසයි. කේවල තත්ත්වයට පත් වූවන්ට පමණක් මෙම යථාර්ථය ග්‍රහණය කර ගත හැකි බව ඔවුන්ගේ අදහසයි. සත්‍යයේ සැබෑ ස්වරූපය ලෙස ජෛනයන් පෙන්වා දෙන යථාර්ථය මෙයයි. බටහිර චින්තකයන් මෙම සංකල්පය වෙනස්වීම මත පදනම්ව නිරීක්ෂණය, ප්‍රත්‍යක්ෂය හා සංජානනය ආශ්‍රිතව සාකච්ඡා කළද අදින් වසර ගණනාවකට පෙරදී පෙරදිග භාරතීයයන් තුළ මෙම සාපේක්ෂ ඥානය පිළිබඳ ප්‍රතිවේදයක් පැවති බව පෙනේ. මෙලෙස ඥානය භව්‍යතාවයෙන් යුක්ත නිසා හා සැමවිටම ඥානය තුළින් ප්‍රතිනිරූපණය වන්නේ අර්ධ සත්‍යයක් නිසාත් මෙය දාර්ශනික විරෝධයට ලක් විය.

## 5. ජෛන ස්‍යාද්වාදය

වස්තූන් දෙස විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් බලා විනිශ්චයන් ලබා දීම ජෛන චින්තකයන් ස්‍යාද්වාදය නමින් හඳුන්වයි. ජෛන දර්ශනයට අනුව සෑම විනිශ්චයකට පළමුව එය සීමිත හා සාපේක්ෂ වීමේ අදහසින් 'ස්‍යාත්' යන විශේෂණය එක් කිරීම අත්‍යවශ්‍ය වූවකි. මේ තුළින් ලැබෙන සත්තාව ත්‍රෛකාලික සත්‍යයක් නොවේ. එහි

වන්නේ සාපේක්ෂ වූ සත්‍යයකි. එනම් සෑම දේශකයම, කාලයකම හා අවස්ථාවකම එකම සත්‍යය ගැබ්ව නොපවතින නිසාවෙනි. මේ නිසා ජෛන ඕනෑම විනිශ්චයාත්මක සාධකයක් සමඟම 'ස්‍යාත්' යන පදය එක් කළ යුතුවේ (පඤ්ඤාකිත්ති හිමි, 1999).

ස්‍යාද් යනු වන්නේය යන අදහස යි. සියල්ල දෘෂ්ටිකෝණයන්ට සාපේක්ෂ වන නිසාත් ඒකාන්ත වශයෙන් යමක් පිළිබඳව විනිශ්චයක් දිය නොහැකි නිසාත් ඔවුන් අනේකාන්තවාදයක් මෙම ස්‍යාද්වාදය ඇසුරෙහි ගෙන හැර දක්වයි. ස්‍යාද්වාදය අනේකාන්තවාදය ලෙසද අන්වර්ථ ගැන්වේ. බුද්ධ සමයේදී අනේකාන්තවාදය පිළිගන්නා ලද දාර්ශනිකයන් සුලබ විය. බ්‍රාහ්මණ හා පරිබ්‍රාජකයන් අතරද මෙය ප්‍රචලිත වූවකි. සංජය බෙල්ලට්ඨිපුත්‍රගේ මත පිළිබඳව සාමඤ්ඤඵල සූත්‍රයේ වන වර්ණනාවන් ස්‍යාද්වාදයට අනුරූප වේ. එහිදී සංජය බෙල්ලට්ඨිපුත්‍රට අනුව පරලොවක් ඇත හෝ නැත යන ප්‍රකාශ දෙකෙහි සත්තාව පිළිබඳව වූ විධානය හා ප්‍රතික්ෂේප කිරීම විෂයෙහි තමාට කිසිවක් ප්‍රකාශ කළ නොහැකි වේ. මේ අනුව ස්‍යාද්වාදයේ මූල ශාඛා ජෛනයන්ගෙන් පරිබාහිර වූ සම්ප්‍රදායන් වලද පවතින බවට ඇතැම් පඬිවරුන් සඳහන් කර ඇත. උපනිෂද් වල බ්‍රහ්ම ඇතැම් විට 'සත්' මෙන්ම ඇතැම් විට 'අසත්' ලෙසත් තවත් තැන්හි 'උභයාත්මක' බවද දක්වා ඇත. මේ නිසා අනේකාන්තවාදී සංකල්පය තහවුරු විය. භගවතී සූත්‍රයේදී මහාවීර විසින් 'ස්‍යාදස්ති, ස්‍යාද්නාස්ති හා ස්‍යාද් අවක්තව්‍යම්' යනාදී වූ මූල භංගයන් පිළිබඳව පැහැදිළි සඳහනක් සිදු කර ඇති නිසාවෙන් 'මූලභංග' නමින් හඳුන්වා ඇත. මෙම මූල භංගයන් එකිනෙක මිශ්‍ර වීමෙන් සප්තභංග යන කල්පනාව ඇති විය (පඤ්ඤාකිත්ති හිමි, 1999).

## 6. අනේකාන්තවාදය

අනේකාන්තවාදය මඟින් සත්‍යයෙහි පවත්නා සාපේක්ෂ බව දක්වයි. අපගේ සෑම විනිශ්චයක්ම මේ තුළ අන්තර්ගත වේ. එනම් අප විසින් කරනු ලබන ප්‍රකාශනයන් සප්තවිධ ප්‍රකාශනයන්ගෙන් කුමකට හෝ අයත් වන බව ජෛනයන්ගේ අදහසයි. මෙය 'සප්තභංගී නය' යනුවෙන් හැඳින්වේ. ලොව පවත්නා කිසිවක් පිළිබඳව ඒකාන්ත ප්‍රකාශන කළ නොහැකි බව දැක්වීම මෙහිදී විෂද කෙරේ.

| | |
|---|---|
| ස්‍යාද් අස්ති. | ඇත්තේ ද විය හැකිය |
| ස්‍යාද් නාස්ති. | නැත්තේ ද විය හැකිය |
| ස්‍යාද් අස්ති නාස්ති. | ඇත්තේ ද නැත්තේ ද විය හැකිය |
| ස්‍යාද් අව්‍යක්තව්‍ය | කිසිවක් කිව නොහැක්කේ ය |
| ස්‍යාද් අස්තිච අවක්තව්‍ය | ඇත්තේ නමුත් කිව නොහැක්කේ ය |
| ස්‍යාද් නාස්තිච අවක්තව්‍ය | නැත්තේ නමුත් කිව නොහැක්කේ ය |
| ස්‍යාද් අස්තිච නාස්තිච අවක්තව්‍ය | ඇත්තේ ද නැත්තේ ද වන නමුත් කිව නොහැක්කේ ය |

(ඤාණිස්සර හිමි, 1988)

උදාහරණයක් මඟින් මෙය මෙලෙස පෙන්වා දිය හැකිය.

| | |
|---|---|
| ස්‍යාද් අස්ති. | කලය රතු පැහැයෙන් ඇත. |
| ස්‍යාද් නාස්ති | කලය රතු පැහැයෙන් නැත. |

(පිලිස්සීමට පෙර කලය කාල වර්ණයෙන් වේ.)

| | |
|---|---|
| ස්‍යාද් අස්ති නාස්ති | කලය රතුය. එසේම කලය රතු නොවේ. |
| ස්‍යාද් අව්‍යක්තව්‍ය | විවිධත්වයක් ගන්නා කලයෙහි යථා වර්ණය පිළිබඳව කිසිවක් කිව නොහැක්කේ ය. |
| ස්‍යාද් අස්තිච අවක්තව්‍ය | කලය විටක රතු පැහැයෙන් යුතුය. එබැවින් අස්තිච වේ. එසේ නොවන අවස්ථා ද පවතී. එබැවින් ඒ පිළිබඳව කිව නොහැක්කේය. |
| ස්‍යාද් නාස්තිච අවක්තව්‍ය | කලය සෑම විටකම රතු පැහැ නොගනී. එබැවින් කලයේ යථා ස්වරූපය පිළිබඳව කිව නොහැක්කේය. |
| ස්‍යාද් අස්තිච නාස්තිච අවක්තව්‍ය | විටෙක කලය රතු පැහැතිය. තවත් විටෙක කලය රතු පැහැ නොවේ. එබැවින් කලයේ වර්ණය පිළිබඳව කිසිවක් කිව නොහැක්කේය. |

මෙය හොඳින් පැහැදිලි කිරීමට අලියා සහ අන්ධයින් සත් දෙනෙකු උපමාවට ගෙන ඇත. ලෝකය පිළිබඳව මිනිසුන් දක්වන අදහස් අලියාගේ ශරීර ස්වාභාවය පිළිබඳව අන්ධයින් විසින් කරනු ලබන විස්තරයට සෑම අතින්ම සමාන බැව් ජෛනයන්ගේ පිළිගැනීමයි. ඕනෑම පුද්ගලයෙක් තම ස්වකීය වූ දෘෂ්ටිකෝණයන්ට සාපේක්ෂව ලෝකය විග්‍රහ කරයි. නමුත් ජෛනයන් පෙන්වා දුන් සප්තභංගී නය ක්‍රමය ඇසුරින් ලෝකය දෙස බලන්නේ නම් විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් බැලීමෙන් සිදුවන වැරදි අර්ථ විග්‍රහයන් ඉවත් කර ගත හැකිය. ලොව වස්තූන් කෙරෙහි ඇල්මක් හෝ බැඳීමක් ඇති වන්නේ නිසැකයෙන්ම එම වස්තූන් පවතින බවට පිළිගැනීමකින් යුක්ත නිසාවෙනි. නමුත් වස්තූන් පවතින්නේ යම් දෘෂ්ටිකෝණයකට සාපේක්ෂව යැයි පිළිගන්නා විට මෙවැනි එල්බ ගැනීම් ඇති නොවේ. ලෝක සත්‍යයට අවහිරයක් නොවන අන්දමේ ප්‍රකාශනයක් කළ හැකි වන්නේ ජෛනයන් පෙන්වා දුන් ස්‍යාද්වාදයට අනුව යම් ප්‍රකාශනයක් සිදු කිරීමෙන් පමණි. මිනිස් ඥානයේ සැබෑ ස්වරූපය මින් ගම්‍ය වේ. ජෛන තාර්කික චින්තනය මේ ඇසුරින් නිර්මිත ය. ඒ අනුව ලෝකයේ ස්වාභාවය

මිනිසුන් තම තමන්ගේ දෘෂ්ටිකෝණයන්ට සාපේක්ෂව විග්‍රහ කරන නිසා ඒවායේ ගැබ් වන්නේ අර්ධ සත්‍යයකි.

## 7. අනෙකුත් දාර්ශනික විග්‍රහයන්

සදාකාලික ලෝකයක් පිළිබඳව අදහස් දැක්වුවද මැවූ ඊශ්වරයෙක් පිළිබඳව කිසිදු සටහනක් ජෛනාගම තුළ නොමැත. විශ්වපුරුෂ සංකල්පයට සමාන ආකාරයකින් පුරුෂ රූපකායක් ඇසුරින් විශ්වය විග්‍රහ කර ඇත. ඔවුන් සිය පදාර්ථ විග්‍රහය තුළ මූලික පදාර්ථ හතක් පිළිබඳව කරුණු දක්වයි. එහිදී ජීව හා අජීව වශයෙන් ප්‍රධාන වූ ද්විත්ව විභේදනයක් ඉදිරිපත් කර දක්වයි. ජීව යන්නට සදාකාලික ආත්මයක් ආදේශිතය. පින් පව් වලට අනුව ඵලවිපාක විඳින්නේ ජීවයයි. සංසාරගතව සිටින ජීවයම අවසානයේදී මෝක්ෂය ලබයි. ජීවය මගින් අරමුණු දැන ගනියි. පුරුෂ නමින් හැඳින්වෙන්නේද මෙම ජීවය යි. අජීව ලෙස හැඳින්වෙන්නේ ද්‍රව්‍ය යි. එසේම අජීව පුද්ගල නමින් අන්වර්ථ ගැන්වේ. මෙම ද්වෛතය අතර බැඳීම කර්මය විසින් ගොඩ නගයි. කර්මය නිසා ආශ්‍රව හෙවත් කෙලෙස් ඇති වේ. ජීව පවතින නිසා ආශ්‍රව ගලා එයි. ජීවය සමඟ ඒවා සම්බන්ධ වීම කිරි සමඟ ජලය මිශ්‍ර වීම හා සමාන වේ. මේ නිසා පුද්ගලයා සංවර විය යුතුය. පින් පව් යනාදියද මීට අයත් වේ. සියලු ආශ්‍රයන්ගේ අරමුණ වන්නේ ජීවය අජීවයෙන් ගලවා ගැනීමයි. මෝක්ෂය ලෙස ඔවුන් දක්වන්නේද එයයි. කර්මය සර්ව ව්‍යාප්ත බවකින් දක්වා ඇති අතර ආත්මයේ දීප්තියට ඉන් බාධා පමුණුවන බව දක්වයි. අත්තකිලමතානුයෝගය නැතිනම් ශරීරයට දැඩි දුක් දීම මාර්ගයෙන් ක්ලේශයන් ප්‍රහීන කළ හැකි බව ජෛනයන්ගේ මතයයි. ඒ සඳහා විවිධ වූ ව්‍රත සමාදන්ව ඇති බව සඳහන් වේ. සංසාරය ඉක්මවීම සඳහා ප්‍රධාන ව්‍රත පහ වශයෙන් පිළිගනු ලබන්නේ අහිංසා, සත්‍යය, අස්තේය (සොරකම් නොකිරීම), බ්‍රහ්මචර්ය, අපරිග්‍රහ (කිසිවක් පිළිබඳ අයිතියක් නැතිවීම) යනාදියයි. ව්‍රත අනුගමනය කිරීමෙන් සංවර තත්ත්වයට පැමිණ ජීවය කර්මයන්ගෙන් ඈත් කරයි. මේ තුළින් නිසැකයෙන්ම මෝක්ෂයට සමීප වේ. ජීවයෙන් විමුක්ති වීමෙන් පසු සංසාරය ඉක්මවීමෙන් පුද්ගලයා නිරන්තරයෙන් වෛරාග්‍ය හෙවත් කෛවල්‍යයට පත් වේ.

පුද්ගල පදාර්ථයේ ඉතාම කුඩා කොටස ලෙස දක්වන්නේ අණු යන්නයි. ඊට අයත් ගුණ ලෙස වර්ණ, ගන්ධ, රස, ස්පර්ශ ද්‍රව්‍යයට අයත් ගුණ ලෙස දැක්වුවද ශබ්දය ඊට අයත් නොවේ. අවශේෂ වූ පදාර්ථයන් ලෙස දක්වන්නේ ආකාශ, ධර්ම, අධර්ම හා කාල යනාදියයි. මේ අතරින් ආකාශ පදාර්ථය තුළ ප්‍රධාන විභේදනයන් ද්විත්වයක් දක්වයි. ඒ ලෝක හා අලෝක ආකාශ යනුවෙනි. ජීව, පුද්ගල ආදී වූ ද්‍රව්‍යයන්ගේ පැවැත්ම යම් කොටසක වේ නම් එය 'ලෝකාකාශ' නම් වේ. ලෝකයට ඉහළින් වූ ආකාශය 'ආලෝකාකාශ' නම් වේ. කේවල ඥානය ලබා ගත්තෝ සිද්ධශීලාවෙහි ජීවත් වෙති. එය පිහිටා ඇත්තේ ලෝකාකාශයෙන් එපිටය (පඤ්ඤාකිත්ති හිමි, 1999). ධර්ම හා අධර්ම යන ද්‍රව්‍යයන් පිළිබඳව වූ ජෛන දෘෂ්ටිය අනෙක් දාර්ශනික පද්ධතීන්හි දෘෂ්ටියට වඩා වෙනස් වේ. ධර්ම හෙවත් ගතිය යනු චලනය වීමයි. ධර්මය තමාම ජීවයේ ගමන මෙහෙයවීම සඳහා අසමත් වුවත් එහි ගමන සඳහා සහායක් ලබා දෙයි. අධර්මය ධර්මයට සාපේක්ෂව විරුද්ධ අර්ථ ගනියි. පවත්නා නීතියෙන් යුත් ජීවය හා පුද්ගලයාගේ පැවැත්මට සහාය වන නිසා ද්‍රව්‍ය අධර්ම ලෙස හැඳින්වේ. කාලය අනුමානය මත රඳා පවතියි. පැවැත්ම, පරිණාමය, ක්‍රියා, පරත්වය හා අපරත්වය යන අංග පහ කාලයට

උපකාර වශයෙන් පිළිගැනේ. මෙය ව්‍යවහාරික හා පරමාර්ථික කාලය ලෙස දෙකොටසකට බෙදේ (පඤ්ඤාකිත්ති හිමි, 1999).

තවද ලෝකයෙහි පවත්නා සෑම වස්තුවකටම ආත්මයක් ඇති බවද ජෛනයන්ගේ පිළිගැනීමයි. ඉතා කුඩා පරමාණුවකට පවා ආත්මයක් පවතින බව ඔවුන්ගේ පිළිගනී. එමෙන්ම ඒ ඒ වස්තූන්ගේ ප්‍රමාණයන්ට සාපේක්ෂව ඒ ඒ ආත්මයන් ද අඩු වැඩි වන බවද ඔවුන් ඉදිරිපත් කරන කරුණකි. සංසාර බන්ධනය ඇති වන්නේ ආත්මය ද්‍රව්‍යයට සම්බන්ධ නිසාවෙනි. මෙම බන්ධනයේ හේතුව කර්මය යි. කර්මය ජෛනයන් දක්වන්නේ දූවිලි මෙන් කුඩා ද්‍රව්‍ය සමූහයක් ලෙසය. පුද්ගල සන්තානයේ පවත්නා ක්ලේශයන් නිසා කර්මය නම් වූ දූවිලි පුද්ගල ආත්මයේ ඇලෙයි. එමෙන්ම ආත්මය පොළොවට බරව පවතින්නේද කර්ම නම් වූ දූවිලි වලින් පිරී ඇති නිසාවෙනි. පුද්ගලයන් සිදු කළ යුත්තේ ආත්මයෙන් කර්ම දූවිලි ඉවත් කර දැමීමයි. ඒ අනුව ආත්මය සැහැල්ලු වේ. එමගින් මෝක්ෂය කරා ළඟා විය හැකිය. (ඤාණිස්සර හිමි, 1988). මෙලෙස කර්ම දූවිලි ඉවත් කළ හැක්කේ ක්ලේශයන් නැති කර දැමීමෙනි. ඒ සඳහා ඔවුන් ශරීරයට දැඩි දුක් දීම හෙවත් අත්තකිලමතානුයෝගය අනුගමනය කරයි. එමගින් මෝක්ෂ සාධනය කර ගනී. මෙසේ සාපේක්ෂ වූ ඥානයක පවත්නා අනේකාන්ත ස්වාභාවය සිය ශ්‍රාවකයන්ට වටහා දෙමින් යථාර්ථවත් කෛවල්‍ය ඥානයක් ඇසුරින් විමුක්තිය සාක්ෂාත් කර ගත හැකි බව ජෛන දර්ශනය මඟින් පෙන්වා දෙයි.

**සමාලෝචනය**

අත්තකිලමතානුයෝගය මත පදනම් ජෛන දර්ශනය අනිශ්වරවාදී පදනමකින් යුත් අවෛදික චින්තන සම්ප්‍රදායකි. වර්ධමාන මහාවීර හෙවත් නිගණ්ඨනාථපුත්ත එහි අවසන් ශාස්තෘවරයා වශයෙන් සැලකේ. ඥානය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ජෛන දර්ශනය ප්‍රත්‍යක්ෂය, අනුමානය හා ආගම ප්‍රමාණ කොට ගනියි. ඉන්ද්‍රියන්ගෙන් හා මනසේ සහයෙන් උපදිනා මති හා ශ්‍රැති ඥානයෙන් ද ආත්මයේ යෝග්‍යතා බලයෙන් උපදිනා අවධි, මනඃපර්යාය හා කේවල යන ඥානයන් ද ප්‍රමාණ කොට ගන්නා ජෛන දර්ශනය අතීන්ද්‍රිය ඥාන මාර්ගයන්හි වැදගත්කම අවධාරණය කරයි. අනේකාන්තවාදය ජෛන දර්ශනයේ මානවීය හා වටිනාකමකින් යුක්ත සංකල්පයකි. සියලු පදාර්ථයන්ගේ එකිනෙක සම්බන්ධයෙන් තොරව සත්‍ය වූ ඥානය පිළිබඳ පහළ වීමක් නොවේ. මේ නිසා නානාත්මක සත්තාව පිළිබඳව වන තාත්වික විග්‍රහය වූ ස්‍යාද්වාදය තහවුරු වේ. ඒ අනුව ඥානය භව්‍යතාවයෙන් යුතු බව පවසන ජෛන ස්‍යාද්වාදය සාපේක්ෂ සත්‍යයක පැවැත්ම අවධාරණය කරයි. ජීව හා අජීව වශයෙන් පදාර්ථයන් ද්වයක පැවැත්ම පැහැදිළි කරන ජෛන චින්තාව දැඩි අවිහිංසාවාදී පදනමක් මත පිහිටයි. විමුක්තිය පරම යහපත සේ සලකන ඔවුහු පෙනීම තුළ පවත්නා සාපේක්ෂතාව යථාර්ථයෙන් වෙන් කොට දැක්වීමට උත්සහ ගනිති. අවිහිංසාව ගුරුකොට ගන්නා ජෛනය දානය, සත්‍ය වචනය, සිත, කය හා වචනය සංවර කර ගැනීම, ලෞකික ආශා ප්‍රහීන කිරීම, සොරකමෙන් වැළකීම සද්ගුණයන් සේ සලකති. තෘෂ්ණාව, වංකබව හා දුරාචාරය පාපයන් සේ සලකති. ජෛන දර්ශනය විශ්වයේ මූලයෙහි ඇති නොයෙක් තත්ත්වයන්ගේ සත්තාව පිළිගෙන ඇති නිසා දාර්ශනික විමසුමේදී එය බහුත්වවාදය සනාථ කරයි. සත්‍යතාව සනාථ කිරීමේදී මනස මෙන්ම බාහිර විශ්වයේ සත්‍යතාව බාහිර ඉන්ද්‍රියයන්ගේ සුසංයෝගයෙන් නිර්මිත වේ. ඒ

අනුව ජෛන දර්ශනයේ දෘෂ්ටියට අනුව 'බහුත්ව සංවලිත වාස්තවවාදය ක් (Pluralistic Realism) වේ.

### ආශ්‍රිත ග්‍රන්ථනාමාවලිය


කළුපහන ජේ., (වර්ෂය සදහන් කර නොමැත). භාරතීය දර්ශන ඉතිහාසය, රාජ්‍ය භාෂා දෙපාර්මේන්තුව, කොළඹ

ඤාණිස්සර හිමි, අල්පිටියේ, (1988), භාරත දර්ශන, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ

පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටිය, (2001), බෞද්ධ දර්ශනය හා ෂඩ් දර්ශනය පිළිබඳව තුලනාත්මක අධ්‍යයනයක්, කොළඹ

පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටිය, (1999), භාරතීය දර්ශන (මහාචාර්ය බලදේව උපාධ්‍යාය), කොළඹ

භාරතීය දර්ශන (මහාචාර්ය බලදේව උපාධ්‍යාය), (1999), සිංහල පරිවර්තනය හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, කොළඹ

රාධක්‍රිෂ්ණන් එස්, (1970), ඉන්දීය දර්ශනය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්මේන්තුව, කොළඹ

විමලධම්ම හිමි, කන්දෙගොඩ, (2006), ඉන්දියානු දර්ශනය, කර්තෘ ප්‍රකාශන

වීරසිංහ එස්. ජී. එම්., (1992), උපනිෂද් දර්ශනය, කොළඹ

හිරියන්න එම්, (1970), සංක්ෂිප්ත ඉන්දීය දර්ශනය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්මේන්තුව, කොළඹ

https://iep.utm.edu/jain/

https://plato.stanford.edu/entries/jaina-philosophy/

https://www.britannica.com/topic/Indian-philosophy/Jain-philosophy